**චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කෙරෙන ප්‍රමුඛතා මාර්ග 3 ව්‍යාපෘතිය (අදියර II) - 2020**

චීන සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කෙරෙන ප්‍රමුඛතා මාර්ග 3 ව්‍යාපෘතිය (අදියර II) හි 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වූ වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැදගත් මාර්ග ප්‍රවේශයන් සහ ගුණාත්මක ප්‍රවාහන යටිතල පහසුකම් සහ සේවාවන් සැපයීම සඳහා දැනට පවතින ජාතික මාර්ග සහ ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම/පුනරුත්ථාපනය කිරීම තුලින් ප්‍රදේශයේ වෙසෙන ජනතාවට සමාජීය සහ ආර්ථික ප්‍රතිලාභ රැසක් ලබා දීම ව්‍යාපෘතියේ පරමාර්ථ වේ. ණය පහසුකම් ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 15,594.14 කට සමාන එ.ජ.ඩො. මිලියන 117.66 ක් වූ අතර ඉන් රු. මිලියන 13,253 කට සමාන එ.ජ.ඩො. මිලියන 100 ක් සැපයීමට චීනයේ චීන සංවර්ධනය සංස්ථාව එකඟ වී තිබුණි.

## 1.3 තත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳව විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 05 හි 36 වැනි ඡේදයට පටහැනිව, විදේශීය මෙහෙයුම් වලින් ඇති වූ විනිමය වෙනස්කම් ව්‍යාපෘතියේ ශුද්ධ වත්කම් යටතේ හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව, 2020 දෙසැම්බර් 31 වන දිනට කෙරීගෙන යන වැඩ රු. මිලියන 377.8 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 05 අනුව ශුද්ධ වත්කම් යටතේ විනිමය අනුපාත වෙනස්කම් සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ. | විදේශීය මෙහෙයුම් වලින් ඇති වූ විනිමය වෙනස්කම් ව්‍යාපෘතියේ ශුද්ධ වත්කම් යටතේ හඳුනාගත යුතුය. |
| (ආ) | ණය ප්‍රතිලාභ බෙදා හැරීමේ ගිවිසුමේ 3(5.5) වගන්තියට අනුව 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරිව තිබූ එ.ජ.ඩො. 82,814.26 ක භාවිතයට නොගත් මුදල මත ගෙවීමට සිදු වන අවදානම් වාරික ගාස්තුව සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන දක්වා නොතිබුණි. | ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 31 වන විට හදිසියේ වසා දමා තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට භාවිතයට නොගත් ණය ශේෂය එ.ජ.ඩො. 82,814.26 කි. ව්‍යාපෘතියට අවදානම් වාරික ගාස්තු සඳහා ප්‍රතිපාදන නොමැති බැවින් අවදානම් වාරික ගාස්තු සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව ප්‍රතිපාදන සැලසිය යුතුය. |

**3.  භෞතික කාර්යසාධනය**

**3.1  ව්‍යාපෘතියේ කටයුතුවල භෞතික ප්‍රගතිය**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොළඹ - නුවර මාර්ගයේ මාවනැල්ල නගරයේ මාර්ග සංවර්ධන කටයුතු 2020 නොවැම්බර් 05 දින අවසන් කළද, ඉදිකිරීම් සඳහා අවසන් ගෙවීම් වෙනුවට රු. මිලියන 287.35 ක් අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා ඇති අතර 2020 දෙසැම්බර් 31 දිනට වැඩබිමේ ඉතිරි වැඩ සඳහා බැංකුවකින් ඇපකරයක් ලබාගෙන ඇත. තවද, ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ යටතේ එම මුදල සටහන් කර ඇති බව නිරීක්ෂණය විය. | 2020 දෙසැම්බර් මාසයෙන් පසු දායකයා විසින් අරමුදල නැවැත්වීමේ හදිසි තීරණය, දැනට කරගෙන යන වැඩ කටයුතු වලට අහිතකර බලපෑමක් නිර්මාණය කර තිබූ අතර, එම කටයුතු තිබූ තත්ත්වයෙන් නැවැත්වීමට හෝ අවසන් කිරීමට කටයුතුවල භෞතික තත්ත්වය ඉතා තීරණාත්මක විය. එම තීරණය පිළිබඳ තොරතුරු සමඟ ප්‍රදේශයේ දේශපාලන බලධාරීන් මෙන්ම මාවනැල්ල නගරයේ සියලුම රාජ්‍ය ආයතන, පළාත් පාලන ආයතන සහ ව්‍යාපාරික ප්‍රජාව නගර සංවර්ධන සැලැස්ම සාර්ථක කර ගැනීම සඳහා එම කාර්යය සම්පූර්ණ කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියට විශාල බලපෑමක් කර තිබිණි. | මාර්ග වැඩවල ඉතිරි ප්‍රතිසංස්කරණයන් කඩිනම් කිරීමටත්, ඉදිරි කොන්ත්‍රාත්වලදී කොන්ත්‍රාත්කරුවන්ට එවැනි ප්‍රතිලාභ ලබා නොදීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | කෑගල්ල - බුලත්කොහුපිටිය - කරවනැල්ල මාර්ගයේ කිලෝමීටර් 1.5 ක මාර්ග වැඩිදියුණු කිරීමේ කටයුතු 2020 අගෝස්තු 06 දින රු. මිලියන 240 ක කොන්ත්‍රාත් වටිනාකමක් මත ආරම්භ කරන ලදී. කෙසේ වෙතත්, පවරා ගැනීමේ සහතිකය අනුව, අරමුදල් අවසන් වීම හේතුවෙන් මීටර් 500 ක් පමණක් සම්පූර්ණ කිරීමට හැකි විය. 2020 දෙසැම්බර් 31 දිනට එම ස්ථානයේ ඉතිරි වැඩ සඳහා බැංකු ඇපකරයකට යටත්ව රු. මිලියන 55.9 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා ඇති අතර එම මුදල කෙරීගෙන යන වැඩ යටතේ වාර්තා කර ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | දායකයා විසින් අරමුදල් සැපයීම හදිසියේ නැවැත්වීම හේතුවෙන් කෙරීගෙන යන වැඩවලට තීරණාත්මක තත්වයක් ඇති වූ අතර එය අවට ප්‍රදේශයේ මාර්ග භාවිතා කරන්නන්ට දුෂ්කරතා රාශියක් නිර්මාණය කර තිබිණි. ඒ අනුව එම ස්ථානයේ සිදුවෙමින් පවතින තීරණාත්මක ක්‍රියාකාරකම් හඳුනා ගැනීමට තීරණය කළ අතර බලපෑමට පත් පාර්ශ්වයන්ට සිදුවන දුෂ්කරතා අවම කිරීම සඳහා බුලත්කොහුපිටිය පොළ ඇතුළු මීටර් 500 මාර්ග කොටස වැඩිදියුණු කිරීමට තීරණය කර ඇත. | මාර්ග වැඩවල ඉතිරි ප්‍රතිසංස්කරණයන් කඩිනම් කිරීමටත්, ඉදිරි කොන්ත්‍රාත්වලදී කොන්ත්‍රාත්කරුවන්ට එවැනි ප්‍රතිලාභ ලබා නොදීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | රු. මිලියන 14.4 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ලබා දී ඇතත්, පදික පාලමේ ඉදිකිරීම් අවසන් කර නොතිබූ අතර 2020 දෙසැම්බර් 31 වන විට පාලමේ කටයුතු අතරමග නතර කර තිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා දැනට ක්‍රියාත්මක වන ණය මුදල නතර කරන ලෙස දායකයා විසින් දන්වන විට ඉදිකිරීම් කටයුතු කරගෙන යාම සඳහා සියලු සැලසුම් යෝජනා අවසන් කර කොන්ත්‍රාත්කරු වෙත භාර දී තිබුණි. | ඉතිරි වැඩ අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවල 14.6 උප වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු අන්තර් ගෙවීම් සහතිකයේ අවම ප්‍රමාණය පිළිගත් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 1.5 කි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට අවශ්‍ය සීමාවට වඩා අඩුවෙන් අන්තර් ගෙවීම් සහතික ඇගයීමට ලක් වූ අවස්ථා 19 ක් නිරීක්ෂණය විය. | සමහර අවස්ථාවලදී කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත පදනම් වූ ගෙවීම අවශ්‍ය සීමාවට වඩා අඩු වුවද ව්‍යාපෘතියේ මුදල් ප්‍රවාහය පවත්වා ගැනීමට සලකා බැලිය යුතුය. | පිරිවැය, කාලය සහ කොන්ත්‍රාත්කරුවන් සඳහා දක්වන විශේෂ අනුග්‍රහය අවම කර ගැනීම සඳහා කොන්ත්‍රාත් කොන්දේසියේ නියම කර ඇති සීමාවන් පිළිපැදීම අවශ්‍ය වේ. |
| (ආ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 14.9 උප වගන්තියට පටහැනිව, දෝෂ දැනුම්දීමේ කාල සීමාව ඉකුත්වීමට පෙර ඉදිකිරීම් කටයුතු 4 කට අදාළ රඳවා ගැනීමේ මුදල් රු. මිලියන 41.2 ක් බැංකු ඇපකරයක් යටතේ ගෙවා තිබුණි. | 2020 දෙසැම්බර් මස අවසන් වන විට මෙම ව්‍යාපෘතිය සඳහා ණය නැවැත්වීම හේතුවෙන්, අවසන් මුදල් ගෙවීමේ කාලය 2020 දෙසැම්බර් 31 ලෙස සැලකේ. ඒ අනුව, ඉංජිනේරුවරයාගේ සහතිකය සමඟ රඳවා තබා ගැනීමේ 2 වන භාගය ඇපකරයක් තබා නිදහස් කර ඇත. | පිරිවැය, කාලය සහ කොන්ත්‍රාත්කරුවන් සඳහා දක්වන විශේෂ අනුග්‍රහය අවම කර ගැනීම සඳහා කොන්ත්‍රාත් කොන්දේසියේ නියම කර ඇති සීමාවන් පිළිපැදීම අවශ්‍ය වේ. |

### 3.3 ක්ෂේත්‍ර පරීක්ෂාවේදී කරන ලද නිරීක්ෂණ

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ජුලි 19 වැනි දින සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂණයේදී කොන්ත්‍රාත්කරු පාලම සඳහා නිර්මාණය කර ඇති ලී කැටයම් සහ රු. මිලියන 7.5 ක් වටිනා වානේ බාල්ක සහ තීරු ඵලදායී කාර්යයක් සඳහා ප්‍රයෝජනයට නොගෙන උප කොන්ත්‍රාත්කරු ගබඩා කර තිබූ බව නිරීක්ෂණය විය. | එය ඵලදායී කාර්යයන් සඳහා භාවිතා කිරීමට අවධානය යොමු කර ඇත. කෙසේ වෙතත්, හුනාන් ව්‍යාපෘතියේ අරමුදල් යටතේ ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු නැවත ආරම්භ කිරීමට සලකා බලන බැවින්, එම වානේ, බාල්ක සහ තීරු ඒ සඳහාම යොදා ගත හැකිය. | එම මිලදී ගත් දැව කැටයම්, වානේ බාල්ක සහ තීරු අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය අවසන් වී ඇතත් පාලමේ ඉදිකිරීම් අවසන් කිරීමට කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එබැවින්, අරමුණ සාක්ෂාත් කර නොගෙන, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීමෙන් සහ ව්‍යාපෘතිය අවසානයේ ඉතිරි ඉදිකිරීම් ද්‍රව්‍ය තබා ගැනීමට ඉඩ දීමෙන් කොන්ත්‍රාත්කරුට විශේෂ ප්‍රතිලාභ ලබා දී තිබුණි. | අදාළ ප්‍රසම්පාදන බලධාරීන්ගේ අනුමැතිය ඇතිව හුනාන් ව්‍යාපෘති අරමුදල් යටතේ ඉතිරි කටයුතු නැවත ආරම්භ කිරීමට සලකා බලනු ලැබේ. | එම මිලදී ගත් දැව කැටයම්, වානේ බාල්ක සහ තීරු අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |